සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

| 54 | S | I |
|---|---|---|

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

## Second Term Test - Grade 13 - 2018

විභාග අංකය .................................

## පෙරදිග සංගීතය I

කාලය පැය දෙකයි

උපදෙස්

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- 1 සිට 25 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරාගෙන එයට හිමි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.
- 26 - 50 දක්වා උත්තර පත්‍රයේම පිළිතුරු සපයන්න.

01. ම ප ධ නි | ස් - නි ස් | යන ලෙස අන්තරා ආරම්භවන සර්ගම් ගීතය අයත් වන රාගය කුමක්ද?

i. හමීර් රාගය　ii. ජෞනපුරි රාගය　iii. දේශ්රාගය

iv. බහාර් රාගය　v. බාගේශ්‍රී රාගය　(........)

02. රි, ප සහ ධ, ග වාදි සංවාදි වන රාග යුගලය පිළිවෙළින් ඇතුළත් පිළිතුර තෝරන්න.

i. ජෞනපුරි - හමීර්　ii. මාල්කෞන්ස් - හමීර්　iii. බ්‍රින්ද්‍රමනි - හමීර්

iv. බහාර් - හමීර්　v. බාගේශ්‍රී - බහාර්　(........)

03. රාගයට අදාල ස්වර සංගති තුල 'රිමප' ස්වර කාණ්ඩය භාවිතා වන නිර්දේශිත රාග තුන ඇතුළත් පිළිතුර තෝරන්න.

i. දේශ්, බ්‍රින්දාමනි, බිහාග්　ii. දේශ්, බිහාග්, බාගේශ්‍රී　iii ජෞන්පුරි, බ්‍රින්දාමනි, දේශ්

iv. බ්‍රින්දාමනි, දේශ්, බහාර්　v. බහාර්, දේශ්, බ්‍රින්දාමනි　(........)

04. i. ග ම ධ නි ධ ම, ii. ග ම ධ නි ධ ම ඉහත සඳහන් ස්වර කාණ්ඩ දෙක අයත් රාග යුගලය පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

i. බාගේශ්‍රී - බහාර්　ii. බාගේශ්‍රී - ජෞනපුරි　iii. මාල්කෞන්ස් - බහාර්

iv. මාල්කෞන්ස් - බාගේශ්‍රී　v. බාගේශ්‍රී - මල්කෞන්ස්　(........)

05. නි ස් නි ප ම ප ග ම රි ස, ස්වර මාලාව අයත් රාගය කුමක්ද?

i. බහාර් රාගය　ii. බ්‍රින්දාමනි සාරංග රාගය　iii. ජෞනපුරි රාගය

iv. දේශ් රාගය　v. ජයජයවන්ති රාගය　(........)

06. නිර්දේශිත රාග අතුරින් පරමේල ප්‍රවේශ රාගය ඇතුලත් පිළිතුර තෝරන්න.

i. බාගේශ්‍රී රාගය　ii. ජයජයවන්ති රාගය　iii. බ්‍රින්දාමනි සාරංග රාගය

iv. බහාර් රාගය　v. මාල්කෞන්ස් රාගය　(........)

07. ගුග ගුග ගුග රිස යන තානාලංකාර කොටස වඩාත් සුදුසු වන්නේ

i. තිහායි සඳහා ය ii. කන් ස්වර සඳහා ය. iii. මුර්කි සඳහා ය.

iv. ගමක් සඳහා ය. v. මීන්ඩ් සඳහා ය. (........)

08. රාග ගාන සමය තීරණය කිරීමේදී 'අද්ව දර්ශක' ස්වරය නොහොත් 'සමය දර්ශක' ස්වරය ලෙස හැඳින්වෙන්නේ

i. 'ස' ස්වරයයි. ii. 'ග' ස්වරය iii. 'ධ' ස්වරයි

iv. 'නි' ස්වරයයි v. 'ම' ස්වරයයි (........)

09. වික්ටර් රත්නායක මහතා විසින් ගයන 'හෝපලු වනපෙත' යන ගීතය නිර්මාණයට ඇසුරු කරගත් රාගය කුමක්ද?

i. බාගේශ්‍රී රාගය ii. දේශ් රාගය iii. මාල්කෞන්ස් රාගය

iv. බහාර් රාගය v. තිලක්කාමෝද් රාගය (........)

10. එක් ස්වරයක සිට තවත් ස්වරයක් දක්වා හඬ නොකඩවා ගමන් කිරීම මේ නමින් හැඳින්වේ.

i. ගමක් ii. කන් iii. මීන්ඩ්

iv. මුර්කි v. උපජ් (........)

11. සමප්‍රකෘති රාග යුගලය තෝරන්න.

i. බාගේශ්‍රී - මාල් කෞන්ස් ii. ආසාවරි - ජෞනපුරි iii. දේශ් - බහාර්

iv. බාගේශ්‍රි - බින්දාමනි v. ආසාවරී - දේශ් (........)

12. මේලයක අඩංගු වන්නේ,

i. ආරෝහණ ස්වර පමණි ii. වාදි සංවාදී ස්වර පමණි iii. අනුවාදි ස්වර පමණි

iv. විවාදි ස්වර පමණි v. විකෘති ස්වර පමණි (........)

13. බටහිර සංගීතයේ ඉහලම හඬ තලය හා පහලම හඬතලය ඇතුලත් පිළිතුර තෝරන්න.

i. බේස් - ටෙනර් ii. සොප්‍රානෝ - ඇල්ටෝ iii. ටෙනර් - ඇල්ටෝ

iv. බෙස් - ඇල්ටෝ v. සොප්‍රානෝ - බේස් (........)

14. ගායන ශෛලින් වලදී චෞතාලය භාවිතා කරන ගායන ශෛලිය තෝරන්න.

i. ඛ්‍යාල් ගායන ශෛලිය ii. ඨුම්රි ගායන ශෛලිය iii. භජන් ගායන ශෛලිය

iv. ද්‍රෘපද් ගායන ශෛලිය v. ධමාර් ගායන ශෛලිය (........)

15. දක්ෂිණ භාරතිය සංගීත පද්ධතිය තුළ භාවිතා වන ප්‍රධාන තත්වාද්‍ය, සහ තාල වාද්‍ය යන භාණ්ඩ දෙක ඇතුළත් පිළිතුර කුමක්ද?

i. බටනලාව - සිතාරය ii. සිතාර - තබ්ලාව iii. විණාව - සටම්

iv. වීණාව - මෘදංගය v. සන්තූර් - මෘදංගය (........)

16. දේශීය සංගීත භාණ්ඩ වර්ගීකරණයේදී දවුල හා තම්මැට්ටම අයත් වන්නේ මින් කුමන භාණ්ඩ වර්ගයටද?

i. විතත - ආතත ii. විතතාතත - විතත iii. ආතත - ඝණ

iv. විතතාතත - ආතත v. ආතත - සුෂිර (........)

17. ගතියෙන් වෙනස් මුත් මිතියෙන් සමාන තාල යුගලය කුමක්ද?

i. දීප්චන්දි - ධමාර් ii. දීප්චන්දි - රූපක් iii. ධමාර් - රූපක්

iv. චෞතාල් - ත්‍රිතාල් v. ත්‍රිතාල් - දීප්චන්දි (........)

18. යුගල වාදනයක් හඳුන්වනු ලබන්නේ,

i. Solo නමිනි. ii. Trio නමිනි. iii. Duet නමිනි.

iv. Quartert නමිනි. v. Harmony නමිනි. (........)

19. කරදිය ඉගිනළුව සහ දෙපානෝ ගීත නාට්‍යය නිර්මාණය කළ ශ්‍රේෂ්ඨ ශිල්පීන්ගේ නම් පිළිවෙලින් සඳහන් පිළිතුර කුමක්ද?

i. චන්න විජේවර්ධන - චිත්‍රසේන

ii. ප්‍රේමසිරි කේමදාස - බැසිල් මිහිරි ගිපැන්න

iii. රෝහ බැද්දගේ - චිත්‍රසේන ගුරින්

iv. ඩබ්. බී. මකුලොලුව - ප්‍රේමසිරි කේමදාස

v. චිත්‍රසේන ගුරින් - ඩබ්. බී. මකුලොලුව (........)

20. 'කැන්ටාටා' ගායන ශෛලිය පදනම් කරගනිමින් ප්‍රේමසිරි කේමදාස සංගීතඥයා නිර්මාණය කළ කෘතිය කුමක්ද?

i. මගේ කාලයේ මව්නි ii. අග්නි iii. සිංහල අවුරුද්ද

iv. පිරිනිවන් මංගල්‍ය v. දොරමඩලාව (........)

21. භාරතීය සංගීතයේ ප්‍රභවය හා සම්බන්ධ වූ ගායනා විශේෂය කුමක්ද?

i. වේදය ii. ශ්ලෝක iii. ජනගී

iv. මූර්චනා v. ග්‍රාම (........)

22. භාත්කණ්ඩේ පඩිතුමා විසින් සම්පාදිත හින්දුස්ථානි සංගීත ග්‍රන්ථය කුමක්ද?

i. ගීත ගෝවින්දය ii. ක්‍රමික් පුස්තක් මාලිකා iii. නාට්‍ය ශාස්ත්‍රය

iv. සංගීත සාර v. බෘහද්දේශී (........)

23. $C^m$ Chord එකට අයත් වන ස්වර ඇතුලත් පිළිතුර තෝරන්න.

i. D F A ii. E G B iii. CE♭G

iv. A C E v. F A♭ C (........)

24. ගීතයක නතුවට සමාන්තරව පදවැලෙහි අර්ථය තීව්‍ර කිරීම සඳහා වැයෙන සංගීත කාණ්ඩය

i. INTRODUCTION ii. INTERLUDE iii. BITS

iv. CHORDS v. COUNTER POINTS (........)

25. තෝඩායම, උරුට්ටුව ආදී ලක්ෂණ ඇතුලත් ශ්‍රී ලංකාවේ ප්‍රචලිත රංග ශෛලිය කුමක්ද?

i. නාඩගම් ii. කෝලම් iii. නූර්ති

iv. සොකරි v. නව නාට්‍ය (........)

- **26 සිට 50 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු හිස්තැන්වල ලියන්න.**

26. හඬ පාලනයකින් යුක්තව භාව ප්‍රකාශ සහිතව ගායනය කළ හැකි නාඩගම් ආභාසය ඇති එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නව නාට්‍යයක් ලෙස .................................................................. නාට්‍යයේ .......................................... යන ගීතය දැක්විය හැකිය.

27. 'පුරන සමුදුර' ලෙසින් ආරම්භ වන සේගීය ..................................... ගී වන අතර 'පෙමින මිතුර' ලෙසින් ආරම්භ වන්නේ .......................................................සම්ප්‍රදායට අයත් වන්නමේ කවියකි.

28. හින්දුස්ථානි මේල දහය ...................................................... පඬිතුමා විසින්ද කර්ණාටක මේල 72 ......................................................... පඬිතුමා විසින් ද නිර්මාණය කරන ලදී.

29. 'සුරතට රැගෙන පන්දම' කවි පාදය ................................ ශාන්ති කර්ම ගණයට ගැනෙන අතර 'වාරේ කීවාට, කජු වාරේද කොස් වාරය ද' යන පද කොටස් පිහිටන ජන ගීත ............................................ ගණයට අයත් වේ.

30. 'මුනිඳුන් දම් සඟ සැරියුත්' යන කවි පාදය ඇතුලත් වන්නම සඳහා ...................................................... බෙරයද 'සේවිත පාද සරෝරුහ' කවි පාදය ඇතුලත් වන්නම සඳහා ...................................................... බෙරයද වාදනය කරයි.

- **අංක 31 - 34 තෙක් ප්‍රශ්න වල හිස් තැන් පිරවීම සඳහා පහත වගුවෙහි විස්තර අදාළ කරගන්න.**

| A | B | C |
|---|---|---|
| • නිශාදය ශුද්ධව හා කෝමලව යෙදේ.<br>• ගාන්ධරය හා ධෛවතය වර්ජිත වේ. | • ගාන්ධාර්ය, ධෛවතය හා නිෂාදය කෝමලව යෙදේ.<br>• ආරෝහණයේදී ගාන්ධාරය නොයෙදේ | • ගාන්ධාරය, ධෛවතය හා නිෂාදය කෝමලව යෙදේ.<br>• ඖඩව ජාතියට අයත් වේ. |

ඉහත A තීරුවට අදාල රාගය 31. ...................................................................... වන අතර

B තීරුවට අදාල රාගය වන්නේ 32. ................................................................ රාගයයි.

C තීරුවට අදාල රාගය වන්නේ 33. ................................................................ රාගයයි.

B තීරුවට අදාල රාගයට සමප්‍රකෘති රාගයක් වන්නේ 34. ........................................................ රාගයයි.

* **අංක 35 සිට 38 තෙක් හිස්තැන් පිරවීම සඳහා පහත ඡේදය උපයෝගී කර ගන්න.**

උසස් පෙළ සිසුවකු වන බණ්ඩාර විසින් තම කේවල ව්‍යාපෘතිය සඳහා සේ ගී ඇසුරින් ප්‍රසංගයක් පවත්වන ලදී. එහිදී පළමු අංගය ලෙස 'ලේසිනොව බැද අල්ලා' යන 35. ...................................................... ගීතයද දෙවන අංගය ලෙස 36. ........................................................ සංගීතයේ ආභාසය ලද 'වරමාති සුභ චරිතේ' යන 37. ................................................ ගීතය ද ඉදිරිපත් කරන ලදී. අවසාන වශයෙන් ඉදිරිපත් කළ නර්තනය සහිත අංගය සඳහා වාදනයට ලබා දුන් | ග ම ප - | - - ප ධ | ප්‍රධ නි ධ ප | ම ග මග රි - යනුවෙන් ආරම්භ වන ස්වර ප්‍රස්තාරයට අයත් 38. ................................................................ වන්නම ඉදිරිපත් කරන ලදී.

* **අංක 39 - 50 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති එක් එක් වගන්තියේ හිස්තැන්වලට වඩාත් සුදුසු වචනය / වචන යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.**

39. පරිගණක සංගීතයේ දී සංගීත නිර්මාණය සඳහා ............................................ මෘදුකාංගය ද සංගීතය පටිගත කිරීම සඳහා ........................................................ මෘදුකාංගයද භාවිතා කළ හැක.

40. MIDI යන කෙටි යෙදුමෙහි අර්ථය ලියන්න. ........................................................................................

41. කර්ණාටක තාල පද්ධතිය නිර්මාණය වී ඇත්තේ ප්‍රධාන තාල ................................................................ ක් හා ජාති ....................................................... ක් මත පදනම් වීමෙනි.

42. රේඛාව චිත්‍රපටයේ සංගීත අධ්‍යක්ෂණය ............................................................ මහතා වන අතර සත් සමුදුර චිත්‍රපටයේ සංගීත අධ්‍යක්ෂණය ............................................................ මහතාගෙනි.

43. ශාස්ත්‍රීය ගායනයක් ඉදිරිපත් කිරිමේදී වඩාත්ම සුදුසු ශ්‍රැති වාදන භාණ්ඩය .................................................. වන අතර තාල වාද්‍ය භාණ්ඩය ......................................................... වේ.

44. පෙරදිග සංගීතය ..................................................................... සිද්ධාන්තය මතද අපරදිග සංගීතය ....................................................... සිද්ධාන්තය මතද නිර්මාණය වී ඇත.

45. 'ගීත වාද්‍යං තතා නෘත්‍යං ත්‍රයං සංගීත මුච්‍යතේ' ලෙස දක්වා ඇත්තේ .................................................. විසින් රචිත .......................................................... ග්‍රන්ථයේ ය.

46. නෙම්, බරන්, ගුළු, පෙලොග් ආදී වශයෙන් ස්වර නම් කරනුයේ ....................................................... සංගීත පද්ධතියේ වන අතර ........................................................ සංගීත පද්ධතියේ ළසු (Lu) නමින් ස්වර හඳුන්වයි.

47. වේද ගීතිකා ......................................... ගාථික, සාමික ................................................... වශයෙන් ස්ථාන 04 ක් මත පිහිටා ගායනා කර ඇත.

48. සේනානායක වේරලියද්ද විසින් ගයන 'නංගිට බැදපු මල් වියනයි' යන ගීතය ............................................................ ගී ඇසුරින් ද' නන්දා මාලනී විසින් ගයන 'රුක් අත්තන මල මුදුනේ' යන ගීතය ....................................................... ගී ඇසුරින් ද නිර්මාණය වී ඇත.

49. කෝරල් සිම්ෆනිය ............................................................... සංගීතඥයාගේ නිර්මාණයක් වන අතර ජුපිටර් සිම්ෆනිය ............................................................... සංගීතඥයාගේ නිර්මාණයකි.

50.  මෙම කි සිග්නේචරයට (KEYSIGNATURE) අදාල මේජර් ස්කේලය (MAJOR SCALE)



මෙම කී සිග්නේචරයෙන් ප්‍රකාශ වන්නේ ................................................ වන අතර .....................................මේජර් ස්කේලයයි.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

54 S II

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018
Second Term Test - Grade 13 - 2018

විභාග අංකය ................................  **පෙරදිග සංගීතය II**  කාලය පැය තුනයි

වැදගත්

I කොටසින් ප්‍රශ්න දෙකකට ද II කොටසින් ප්‍රශ්න එකකට ද III වන කොටසින් ප්‍රශ්න දෙකකට ද ආදී වශයෙන් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් ලැබේ.

## I කොටස

01. පහත දැක්වෙන්නේ රාග විස්තර ඇතුළත් වගුවකි.

| රාගය | මේලය | අරෝහණ | වාදි / සංවාදි | මුඛ්‍යාංගය |
|---|---|---|---|---|
| I ........ | කාෆී | II ........ | III ........ | ස නි̣ ධ̣ ස, මධනිධම, මගරිස |
| දේශ් | IV ........ | ස, රි ම, ප නි සं | V ........ | VI ........ |
| VII ........ | භෛරවී | VII ........ | ම, ස | ම ග, ම ධ නි සं, මග, ස |
| IX ........ | බිලාවල් | X ........ | ග නි | XI ........ |
| ජෞනපුරි | XII ........ | XIII ........ | XIV ........ | ම ප නි ධ ප, ධ, ම ප ග රි ම ප, |

i. ඉහත වගුවෙහි I සිට XIV තෙක් ඇති හිස්තැන් සඳහා ගැලපෙන පිළිතුරු අදාල ඉලක්කම ද සමඟ පිළිතුරු පත්‍රයෙහි ලියන්න. (½ x 14) (ල. 07)

ii. ඉහත වගුවෙහි B හෝ C තීරුවලට අයත් රාගයන්ගෙන් එක් රාගයකට අදාළ මධ්‍යලය ඛ්‍යාල ගීතයක හෝ ලක්ෂණ ගීතයක හෝ වාදිතයක හෝ අන්තරා කොටසක් නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ල. 09)

iii. A තීරුවට අයත් රාගයට අදාල මාත්‍රා 08 කට නොඅඩු තානාලංකාර දෙකක් තාලානුකූලව ප්‍රස්තාර කරන්න. (ල. 04)

2. පහත දැක්වෙනුයේ නිර්දේශිත රාග 04 කට අයත් ස්වර සංගතීන්ය.

A. ප̣ නි̣ ස රි ග ස, රි ප ම ග, සනි̣

B. නි̣ ස රි, මරි, පමරි, සරි, නි̣ස, නි̣පමරිස

C. නි̣, ස, ධ̣ නි̣ රි, ගමප, ගමරිගුරි

D. සරිස, ගමධ, නිධ, සंනිධප

i. ඉහත ස්වර සංගතින් අයත් වන රාග 04 පිළිවෙලින් නම් කරන්න. (ල. 08)

ii. ඉහත A හෝ B රාග දෙකින් එක් රාගයකට අයත් මධ්‍යලය ඛ්‍යාල ගීතයක හෝ ලක්ෂණ ගීතයක හෝ මධ්‍යලය වාදිතයක හෝ ස්ථායි කොටසේ ස්වර ප්‍රස්තාරය නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ල. 08)

iii. ඉහත C හෝ D රාග දෙකින් එක් රාගයකට අදාළ මාත්‍රා 08 කට නොඅඩු තනාලංකාර දෙකක් තාලානුකූලව ප්‍රස්තාර කරන්න. (ල. 04)

03. පහත A, B, C, D වලින් දැක්වෙන්නේ නිර්දේශිත තබ්ලායේකා 04 කට අයත් අවනද්ධ අක්ෂර ඇතුළත් තොරතුරු වගුවකි.

| A | B |
|---|---|
| ගෙතිට | ධ ධිං + |
| C | D |
| ධ ධිං ධිං ධ | තිට කත |

i. මෙම තාල පද 4 හඳුනාගෙන අදාල ඉංග්‍රිසි අක්ෂරය සමඟ තාලයේ නම ලියන්න. (ල. 04)

ii. ඔබ නම් කළ A සහ D තාල දෙකෙහි සම විෂමතා සංසන්දනාත්මකව ලියා දක්වන්න. (කරුණු 04 ක් සැහේ) (ල. 08)

iii. ඉහත ඔබ නම් කළ තාල 04 න් මාත්‍රා 14 කින් යුත් තාලය සම / දෙගුණ වශයෙන් නියමිත තාල සංකේත සහිතව ප්‍රස්තාර කර දක්වන්න. (ල. 06)

iv. B සහ C තාල දෙකට සමානව මාත්‍රා කැටිවන දේශීය තිත් රූප දෙක නම් කරන්න. (ල. 02)

## <u>II කොටස</u>

04. i. ලංකීය සංගීතයේ ගමන් මග දෙස හැරී බැලමේදී ඊට අදාල යුග කිහිපයක් හඳුනාගත හැකිය. එයින් මහනුවර යුගයේදී ලංකීය සංගීතය පෝෂණය වූ ආකාරය පිළිබඳ රාජසභා සංගීතය ඇසුරින් විග්‍රහයක යෙදෙන්න. (ල. 08)

ii. නූර්ති හා නාඩගම් ශෛලින් දෙක අතර විශේෂතා වගුගත කරන්න. (ල. 08)

iii. ඔබ උගත් නිර්දේශිත නූර්ති ගීතයක පළමු පාද දෙක ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 04

05. පහත දැක්වෙනුයේ දේශීය ජන ගී කිහිපයක මුල් පාදයන් ය.

- ලක්ෂ්මී බුජ වාසා
- අම්මපල්ල බඹරුන් අත වරද නැති
- මොහු හැර වෙන දන් ගන්නෝ නැද්දෝ
- ගුණ දැනේ බෝසත් අනේ
- පැහැසරණිය මිණිපැමිණිය
- ඈත එපිට දීපන්කර මුනි විවරණ ගන්නේ
- කලුවන් කළු රුවයි මංගෝ දිලිසෙනවා
- යමු යමු කැකුලේ යමු කැකුලේ
- ලේසි නොව බැඳ අල්ලා
- ගම්බීරත් තාලෙට වාලඟ නටවමිනා

i. ඉහත ගී පාද සේ ගී හා ගැමි ගී වශයෙන් වෙන්කර ලියා දක්වන්න. (ල. 05)

ii. ගැමි ගී සන්නිවේදන කාරකයක් වශයෙන් යොදාගත් අවස්ථා උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 08)


iii. 'ඈත එපිට දීපංකර මුනි විවරණ ගන්නේ' යන ගී පාදය කුමන ගී වර්ගයකට අයත් දැයි නම් කර එම ගී වර්ගය පිළිබඳ සංගීතමය ලක්ෂණ දෙකක් සහිතව කරුණු 06 ක් ලියා දක්වන්න. (ල. 07)

## III කොටස

06. පහත මාතෘකා 04 ක් පිළිබඳ කෙටි සටහන් උදාහරණ සහිතව ලියන්න. ( එක් මාතෘකාවක් සඳහා සුවිශේෂි කරුණු 05 ක් වත් අන්තර්ගත විය යුතුය)

i. ඔපෙරා සහ බැලේ නාට්‍ය සංගීතය
ii. පංචතූර්ය නාදය
iii. අපරදිග තූර්ය වාදක කණ්ඩායමක සංයුතිය
iv. ශිල්පි ජග්ජිත් සිං
v. තානාලංකාර වර්ග
vi. අමදියෙස් මෝසාර්ට්

07. පහත දැක්වෙනුයේ සංගිත භාණ්ඩ වර්ගීකරණයන් **තුනට** අයත් සංගීත භාණ්ඩ වලට අයත් රූප ඇතුලත් වගුවකි.





i. සංගීත භාණ්ඩ වර්ගීකරණයේදී වගුවේ දී ඇති A, B, C කාණ්ඩ තුනට අයත් වර්ගීකරණයන් ඉංග්‍රිසි අක්ෂරයද සමඟ ලියා දක්වන්න. (ල. 06)

ii. B කාණ්ඩයට ඇතුලත් භාණ්ඩ නම්කර ස්වර පිහිටීම අතින් සමාන සංගීත භාණ්ඩ යුගලයෙහි සම විෂමතා 04 ක් ලියන්න. (ල. 06)

iii. C කාණ්ඩයෙහි ඇතුලත් Strings (ස්ට්‍රින්ග්) වර්ගයට අයත් සංගීත භාණ්ඩය නම් කර එම සංගීත භාණ්ඩ පවුලට අයත් භාණ්ඩ සහ ඊට අදාල හඬතලයන් පිළිවෙලින් ලියා දක්වන්න. (ල. 08)

08. පහත දැක්වෙන බටහිර සංගීත ප්‍රස්තාරය ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




i. ඉහත අංක 1,2,3,4 යන අංක වලින් දැක්වෙන සංකේත නම් කරන්න. (ල. 04)

ii. ඉහත බටහිර සංගීත ස්වර ප්‍රස්තාර පෙරදිග ක්‍රමයට නැවත ප්‍රස්තාර කර ඊට ගැලපෙන කෝඩ්ස් යොදන්න. (ල. 10)

iii. ඉහත පෙරදිග ප්‍රස්තාරය මධ්‍යම භාවයට හරවා නැවත ප්‍රස්තාර කරන්න. (ල. 06)

# දෙවන වාර පරීක්ෂණය 2018 - පෙරදිග සංගීතය 13 ශ්‍රේණිය

## I පත්‍රය

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | 2 | 11. | 2 | 21. | 1 |
| 2. | 3 | 12. | 1 | 22. | 2 |
| 3. | 3 | 13. | 5 | 23. | 3 |
| 4. | 4 | 14. | 4 | 24. | 5 |
| 5. | 1 | 15. | 4 | 25. | 1 |
| 6. | 2 | 16. | 2 | | |
| 7. | 4 | 17. | 1 | | |
| 8. | 5 | 18. | 3 | | |
| 9. | 1 | 19. | 5 | | |
| 10. | 3 | 20. | 4 | | |

(ලකුණු 1x25=25)

**26 සිට 50 දක්වා පිළිතුරු වලට ලකුණු භාග (½) හිමි නොවේ.**

26. 1. සිංහබාහු 2. ගල්ලෙන බිඳලා
27. 1. හටන් 2. සබරගමු
28. 1. භාත්කණ්ඩේ පඬිතුමා 2. ව්‍යාංබට මුඛී පඬිතුමා
29. 1. උඩරට ශාන්තිකර්ම 2. ටීකා සී පද
30. 1. උඩරට බෙරය 2. පහතරට බෙරය
31. බින්ද්‍රාබනී සාරාංග
32. ජෞනපුරි
33. ආසාවරි
34. ආසාවරි
35. හටන්
36. දකුණු ඉන්දීය / කර්ණාටක
37. ප්‍රශස්ති
38. අසදෘෂ
39. 1. Reason, CuBase, Fruti loops ආදී මෘදුකාංග
    2. NUENDO, CUBASE, ADOBE AUDITION, Sound forge
40. සංගීතමය නාද විද්‍යුත් අංකිත ක්‍රමයට පරිවර්තනය කිරීමකි.
41. 1. 7 ක් 2. 5 ක්
42. 1. බී.එස් පෙරේරා මහතා 2. සෝමදාස ඇල්විටිගල මහතා
43. 1. තාම්පුරාව 2. තබ්ලාව
44. 1. පෙරදිග සංගීතය - Melody 2. අපරදිග සංගීතය - Harmony
45. 1. සාරාංගදේව 2. සංගීත රත්නාකරය
46. 1. ගම්ලෑන් සංගීතය 2. චීන සංගීතය
47. 1. ආර්චික 2. ස්වරාන්තරික
48. 1. වැදි ගී 2. වන්නම් / උඩරට වන්නම්
49. 1. බීතෝවන් 2. මෝසට්
50. 1. F Major Scale 2. E Flat Major Scale

# දෙවන වාර පරීක්ෂණය - පෙරදිග සංගීතය 13 ශ්‍රේණිය

## II පත්‍රය

- **I, II, III කොටස් වලින් ප්‍රශ්න තෝරා ගැනීම නිවැරදි විය යුතුය.**

01. i බාගේශ්‍රී
ii. ස, නි ධ නි ස, මග, මධනිස
iii. ම, ස
vi. රිමප, නිධප, පධපමගරි, ගස
vii. මාලකෞන්ස්
viii. නිස, ගම, ධ නි ස
xi. නිස, ගමප, ගමග, රිස
xii. ආසාවරී
xiii. ස, රිමප, ධ නි ස

iv. ඛමාජ් ix. බිහාග් xiv. ධ - ග

v. රි - ප x. ස, ගමප, නිස් (ල. ½ x 14 = 07)

ii. දේශ් හෝ මාලකෞන්ස් යන රාග වලින් එකකට අයත් නිවැරදි ස්වර ප්‍රස්තාරය ලියා ඇත්නම් (ල.09) තාල සංඥා නිවැරදි නොවේ නම් එක් ලකුණක් අඩු කරන්න.)

iii. නිවැරදි තානාලංකාර දෙක සඳහා (ල.04)

02. i a. තිලක්කාමෝද් රාගය

b. බ්‍රින්දාමනි සාරංග රාගය

c. ජයජයවන්ති රාගය

e. හමීර් රාගය (ල. 02 x 04 = 08)

ii. තිලක්කාමෝද් හෝ බ්‍රින්දාමනී සාරංග රාගයන්ගෙන් එකකට අයත් නිවැරදි ස්වර ප්‍රස්තාරයට (ල. 08)

iii. තානාලංකාර දෙක සඳහා (ල.04) ජයජයවන්ති හා හමීර්

03. a. ධමාර් තාලය b. දීප්චන්දි තලය c. ත්‍රිතාල්ය d. චෞතාලය (ල. 01 x 04 = 04)

ii. ධමාර් සහ චෞතාලය පිළිබඳව සංසන්දනාත්මක කරුණු ලියා ඇත්නම් (ල. 08)

iii. දීප් චන්දි තාලය සම දෙගුණ වශයෙන් ප්‍රස්තාර කිරීමට (ල. 06)

iv. B දීප්චන්දිතාලය - මැදුම් මහ දෙතිත

C - ත්‍රී තාලය - මහ තනි තිත

04. i. නිවැරදිව කරුණු දක්වා ඇත්නම් (ල. 08)

ii. එක් ශෛලියක් සඳහා අවම වශයෙන් කරුණු 04 ක් ලියා ඇත්නම් (ල. 2 x 4= 08)

iii. නිවැරදිව ගීත ස්වර ප්‍රස්තාරය ලියා ඇත්නම් (ල. 04)

05. i. ගැමි ගී

1. අම්මාපල්ල බඩරුන් අත වරු නැති
2. ගුණ දැනේ බෝසත් අනේ
3. ඇත එපිට දීපංකර
4. කළුවන් කළු රුවයි මංගෝ
5. යමු යමු කැකුලේ යමු කැකුලේ

සේ ගී

1. ලක්ෂ්මී භුජ වාසා
2. මොහු හැර වෙන් දන් ගන්නෝ නැද්දෝ
3. පැහැසරණිය මිණි පැමිණිය
4. ලේසි නොව බැඳ අල්ලා
5. ගම්භීරන් තාලෙට වාලඟ නටවමිනා (ල. 05)

ii. උදාහරණ සහිතව ලියා ඇත්නම් (ල. 08)

iii. උඩරට ශාන්තිකර්ම ලෙස නම් කිරීමට (ල. 01)

සංගීතමය කරුණු 02 ක් ඇතුලත් ව කරුණු 06 ක් ලියා ඇත්නම් (ල. 06)

v. අලිඅක්බර් ඛාන් (සරෝද්) / යෙහුදි මෙනුහින් (වයලින්)/ බිස්මිල්ලා ඛාන් (ෂනායි)

06. නිවැරදි පිළිතුරු ලියා ඇත්නම් එක් කරුණකට ලකුණු 05 බැගින් ලකුණු 20 කි.

07. I A - දේශීය භාණ්ඩ වර්ගීකරණය B - පෙරදිග භාණ්ඩ වර්ගීකරණය

C - අපරදිග / බටහිර භාණ්ඩ වර්ගීකරණය

II භාණ්ඩ නම් කිරීම (ල. ½ x 4 = 02)

සමාන, අසමානතා කරුණු 04 ලකුණු 04 (ල. 06)

III භාණ්ඩ පවුල නම් කිරීම සහ භාණ්ඩයට අදාල හඬතලයන් පිළිවෙලින් ලියා ඇත්නම් (ල. 08)

08. 1. Time Signature 2. Crotchet Rest Mark 3. Tie 4. Quaver (ල. 04)

ii.

